**ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 18 දින අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 77.35 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 53.14 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 24.21 ක් හෙවත් සියයට 31.30 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 74.75 | 52.00 | 22.75 | 30.43 |
| මූලධන | 2.60 | 1.14 | 1.46 | 56.15 |
| **එකතුව** | **77.35** | **53.14** | **24.21** | **31.30** |

## 2.2 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත 02 ක් සඳහා එකතුව රු.මිලියන 5,000.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 8,029.97 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 160.60 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10.02.10.00 | - | 3,029.97 | 3,029.97 | - |
| 20.05.01.00 | 5,000.00 | 5,000.00 | - | - |
| **එකතුව** | **5,000.00** | **8,029.97** | **3,029.97** | **60.6** |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 23801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3.00 | 2.96 | 1.3 | 1.78 | 12.00 | 7.62 |

## 2.4 විගණන නිරීක්ෂණය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විසර්ජන ගිණුම

#### 3.1.1 අයවැය විචලනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලධන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.මිලියන එකක ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 9 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 61 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### 3.2 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේතාංක 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) 10.02.10.00 දරන ආදායම් සංකේතය - සමාජ වගකීම් බද්ද**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 දෙසැම්බර් 22 දිනැති අංක 254/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වර්ෂය සඳහා ආදායම් ගිණුම් 2017 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2016 වර්ෂයේ ආදායම් ගිණුම 2017 අප්‍රේල් 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ii) ආදායම් ගිණුමට අදාළව 2016 වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 9.00 ක ආදායම් රැස්කර තිබුණි.

(iii) ආදායම් ගිණුමේ සඳහන් සියළුම සංඛ්‍යා භාණ්ඩාගාර පොත් සමඟ සැසඳෙන බවට අධ්‍යක්ෂ ජනරාල් විසින් තහවුරු කර තිබුණද, ආදායම් ගිණුම අනුව 2016 වර්ෂයේදී රැස් කරන ලද මුළු ශුද්ධ ආදායම රු.3,029,972 ක් වී තිබුණත්, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එය රු.8,999,016 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.5,969,044 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iv) මුදල් රෙගුලාසි 128(2)(ඇ) හා 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 08 ඡේදය ප්‍රකාරව 2016 පළමු අර්ධ වර්ෂ සඳහා සමාජ වගකීම් බද්දට අදාල හිඟ වාර්තාව 2016 ජූලි 31 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එය 2017 ජනවාරි 31 දින ඉදිරිපත් කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට අදාළ හිඟ

ආදායම් වාර්තා 2017 සැප්තැම්බර් 18 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(v) සමාජ වගකීම් බද්දෙහි හිඟ ආදායම් පවතිනුයේ රාජ්‍ය ආයතනවලින් වීම හා එම ණය දී ඇත්තේ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව වීම නිසා ඉදිරි අයවැය ප්‍රතිපාදනවලින් අදාළ හිඟ ආදායම් අයකර ගත හැකි බව ශ්‍රී ලංකා රේගුව විසින් 2012, 2013, 2014, 2015 හා 2016 වර්ෂවලට අදාළ හිඟ ආදායම් වාර්තා මගින් දක්වා තිබුණි. එසේ වුවත්, දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර හිඟ ආදායම් ලබා ගැනීමට හෝ එම හිඟ ආදායම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(vi) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව විසින් විගණනයට ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව, 2016 ජනවාරි 01 දිනට හිඟ ආදායම් ශේෂ හා ආදායම් ගිණුමේ සඳහන් කර තිබුණු ශේෂ අතර එකතුව රු.2,527,281 ක වෙනසක් පැවතුණි.

(vii) හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නිරන්තර සිහි කැඳවීම් යවන බව ගිණුමේ සඳහන් කර තිබුණද, 2016 වර්ෂයේදී එසේ කටයුතු කර නොතිබුණි. එසේම එක් එක් අංශවලට අදාළව හිඟ බදු පිළිබඳ තොරතුරුද ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) 20.05.01.00 දරන ආදායම් සංකේතය - මහ බැංකුවේ ලාභ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ආදායම් සංකේතය යටතේ පසුගිය වර්ෂයේදී ආදායම් රැස්කර නොතිබුණත්, සමාලෝචිත වර්ෂය සඳහා මූලික ඇස්තමේන්තුව රු.මිලියන 12,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. පසුව එම ඇස්තමේන්තුව රු.මිලියන 5,000 ක් දක්වා සංශෝධනය කර තිබුණි.

(ii). 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අනුව, බදු පසු ශුද්ධ ලාභයෙන් ඒකාබද්ධ අරමුදල සඳහා වෙන්කළ ලාභය රු. මිලියන 6,378.27 ක් වී තිබුණද, 2016 වර්ෂයේදී මහ බැංකුවේ ලාභ ආදායම් සංකේතය යටතේ රු.මිලියන 5,000.00 ක ශුද්ධ ආදායමක් ලැබී තිබුණි. මෙහිදී ජොෂ්ඨ පුරවැසි ඉතුරුම්වල පොලී ගෙවීමේ වැඩසටහන සඳහා රු.මිලියන 1,300.00 ක් ලබාදී තිබුණු අතර ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණු බව දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත දන්වා තිබුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව පළාත් සභාවකට ස්ථාන මාරු වී යන නිලධාරීන්ගේ ණය ශේෂය එකවර අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද, 2002 මැයි මාසයේදී පළාත් සභාවකට ස්ථාන මාරු වී ගිය නිලධාරිනියකගේ රු.64,488 ක් වූ ණය ශේෂය වර්ෂ 6 ක කාලයක සිට පැවත එමින් තිබුණත්, එම ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම**

දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ අයවැය ඇස්තමේන්තුව හා ප්‍රසම්පාදන සැලැස්ම අතර වෙනස්කම් නිරීක්ෂණය වූ බැවින් ප්‍රසම්පාදන සැලැස්ම, අයවැය ඇස්තමේන්තු හා එකඟ වී නොතිබුණි.

**3.5 බේරුම් නොකළ බැරකම්**

බැරකම් ලේඛනය අනුව, මුදල් අමාත්‍යාංශයට ගෙවිය යුතු රු.182,000 ක බැරකම විගණිත දිනය වූ 2017 මැයි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**3.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XV පරිච්ඡේදයේ 9.6 වගන්තිය | 47,450 | විදේශගත වූ නිලධාරීන් තිදෙනෙකුට උණුසුම් ඇඳුම් දීමනා වශයෙන් රු.47,450 ක් ගෙවා තිබුණි. ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ලබා ගත් මුදල් ඒ සඳහා වැය කළ බව සනාථ කෙරෙන සහතික හැකිතාක් ඉක්මණින් අදාළ නිලධාරීන් විසින් ඉදිරිපත් කළ යුතු වුවත්, එම සහතික විදේශ ගමනින් පසු දිවයිනට පැමිණ මාස 03 ක සිට සිට මාස 06 ක් දක්වා කාල පරාසයක පමාවකින් පසුව ඉදිරිපත් කර තිබුණි. |

(ආ) XV පරිච්ඡේදයේ 9.4 වගන්තිය - උණුසුම් ඇඳුම් දීමනාව වර්ෂ ක 05 ට වරක් පමණක් ලබා දිය යුතු වුවත්, ඒ බව සනාථ කර ගැනීම සඳහා ලේඛනයක් දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

## 3.7 කාර්යසාධනය

---------------

2016 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තු ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් රජයේ සමස්ථ ආදායම පුරෝකථනය කිරීම පිළිබඳව ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව, රජයේ මුළු ආදායම රු. බිලියන 2,005 ක් වූ අතර තථ්‍ය ආදායම රු.බිලියන 1,725 ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තු කළ ආදායමෙන් සියයට 86.03 ක ප්‍රමාණයක ආදායම් රැස්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේතය 32 ක් යටතේ ඇස්තමේන්තු කළ ආදායම සියයට 10 ක සිට සියයට 3098 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. ආදායම් සංකේත 32 කින් ඇස්තමේන්තු කළ ආදායමෙන් සියයට 11 සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් අඩුවෙන් ආදායම් රැස්කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී අදායම් සංකේත 47 කට අදාළ ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. ඉන් ආදායම් සංකේත 32 කින් සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සියයට 11 ක සිට සියයට 2,775 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. තවත් ආදායම් සංකේත 15 කින් සංශෝධනය කරන ලද ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 13 ක සිට සියයට 90 ක් දක්වා ප්‍රමාණයකින් ආදායම් රැස්කිරිමට නොහැකි වී තිබුණි.

(iii) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ආදායම් සංකේත කිහිපයකින් ආදායම් රැස් කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා මූලික ඇස්තමේන්තුවක් හෝ සංශෝධිත ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. එම ආදායම් සංකේත අහෝසි කර ඇති බවත්, එම ආදායම් සංකේතවලින් හිඟ ආදායම් එකතු වන බව දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(iv) මූලික ආදායම් ඇස්තමේන්තුවේ සඳහන් ආදායම අඩු කර ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එසේ සංශෝධිත ඇස්තමේන්තු පිළියෙල කර තිබුණු ආදායම් සංකේත 09 කින් මුල් ආදායම් ඇස්තමේන්තුවද ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. මේ අනුව එම අදායම් සංකේතවල ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කිරීම තාත්ත්විකව සිදු කර නොතිබුණි.

(v) ප්‍රාදේශීය සභා හා භාරකාර ආදායම් (Developed Revenue) සඳහා වන තථ්‍ය ආදායම් විස්තර රැස් කිරීම පිළිබඳ වාර්තා තබා ගත් බවට හෝ විශ්ලේෂණය සිදු කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vi) අංක 1002.05.02 දරන මත්පැන් බද්ද සඳහා වන ආදායම් සංකේතය වෙනුවෙන් මූලික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. නමුත් එම ආදායම් සංකේතය සඳහා රු.මිලියන 50 ක සංශෝධිත ඇස්තමේන්තු පිළියෙල කර තිබුණද, කිසිදු ආදායමක් සමාලෝචිත වර්ෂයේදී රැස්කර නොතිබුණි.

(vii) ආදායම් සංකේත 02 ක එකතුව රු.මිලියන 151,230 ක් වූ මූලික ඇස්තමේන්තු සකස් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී ඉන් ආදායම් වශයෙන් රු.මිලියන 5,000 ක් පමණක් රැස් කර තිබුණි. ආදායම් සංකේතවලින් අදායම් රැස්කිරීම කෙරෙහි අවධානය යොමු නොකිරීම නිසා එම ආදායම් සංකේතවල ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි..

(viii) ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු නොසලකා ඊට වඩා වැඩි ඇස්තමේන්තු / සංශෝධනයන් සිදු කිරීම හේතුවෙන් ඇස්තමේන්තු හා තථ්‍ය ආදායම් අතර විචලතාවය වැඩි වූ අවස්ථාද නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තු/සංශෝධිත ඇස්තමේන්තු අගයන් මෙන්ම සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ අපේක්ෂිත විචලනයන්, විනිමය අනුපාත, පොළී අනුපාත ආදියෙහි අපේක්ෂිත හැසිරීම්, ඉකුත් වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේ මුල් මාස කිහිපයෙහි ආදායමේ කාර්යසාධනය ආදිය පිළිබඳව අවධානය යොමුකර සංශෝධනයන් සිදු කරන බව දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ix) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් හෝ අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් එක් එක් ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කළ යුතු ආදායම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් මාර්ගෝපදේශයන් / උපදෙස් නිකුත් නොකිරීම හේතුවෙන් නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි ආදායමෙන් ආපසු ගෙවීම් මෙන්ම වැරදි නිවැරදි කිරීම්ද පෙර වර්ෂයට වඩා වැඩි වූ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, සුනාමි ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන කටයුතු සඳහා කල් තබන ලද එකතු කළ අගය මත බදු (VAT) සහන ලබාදීම එක් කාර්යයක් වී තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.5,676,375 ක් නිරවුල් කර තිබුණි. ඉහත එකතු කළ අගය මත බදු පහසුකම අම්පාර, කල්මුණේ ප්‍රදේශයේ පිහිටි සරස්වතී විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ඉටු කළ කොන්ත්‍රාත් ආයතනයක් විසින් ලබාගෙන තිබුණි. ඊට අදාළ තොරතුරු ලෙස 2007 නොවැම්බර් 12 දිනැති බදු ඉන්වොයිසියක පිටපතක් හා People in need ලිපි ආවරණය යටතේ 2014 අප්‍රේල් 07 දිනැතිව දෙපාර්තමේන්තුව වෙත ඍජුව එවන ලද ඉන්වොයිස්වල ඡායාපිටපත් ඒවා තිබුණි. මෙම ගෙවීම සඳහා එම තොරතුරු හැර වෙනත් කිසිදු තොරතුරක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂයේ විගණනයෙන් පෙන්වා දුන් පරිදි සුනාමි බදු සහන ලබාදීම සඳහා යාවත්කාලීන නොවන ව්‍යාපෘති ලේඛනයක් දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණි. එම ගෙවීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් අපේක්ෂාවෙන් පෙර පරිදි ගෙවීම් කරමින් පැවතුණි. එම

ලේඛනය අනුව ව්‍යාපෘතිය සඳහා රු.39,376,949 ක වටිනාකමක් ඇතුළත්ව තිබුණද 2016 දෙසැම්බර් 27 දින වන විටත් ව්‍යාපෘතියේ නිම කළ වැඩවල ප්‍රතිශතය ශුන්‍ය අගයක් ගෙන තිබුණි. ඉහත සඳහන් බදු මුදලෙන් අදාළ අයවිය යුතු මුදල් අයකර ගෙන 238-1-1-0-1405 වැය විෂයට හර කර අදාළ බදු මුදල නිදහස් කර ඒ බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වාර්තාවක් ලබා දෙන බව දන්වා තිබුණි. 2017 ඔක්තෝබර් 18 දින වන විටත් එම වාර්තාව ලබා ගත් බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ සඳහන් විධිවිධාන අනුව එකතු කළ අගය මත බදු නිදහස් කිරීම්වලට අදාළ වාර්තා මාස 03 කට වරක් මුදල් අමාත්‍යවරයා වෙත වාර්තා ඉදිරිපත් කළ යුතුව තිබුණි. 2016 ඔක්තෝබර් 24 දින සිට රාජ්‍ය නොවන සංවිධාන විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති මඟින් ලබාදෙන ප්‍රදාන ආධාර මත මෙරටට ගෙන්වනු ලබන භාණ්ඩ සඳහා වත්කම් මත අය කරනු ලබන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම නවතා තිබුණු බවත්, ඒ අනුව එදිනෙන් පසු ඊට අදාළ වාර්තා නිකුත් කර නොමැති බවත්, විගණනය වෙත දන්වා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් අවසන් වරට 2016 ජුනි 01 දින සිට අගෝස්තු 31 දින දක්වා කාලයට අදාළ වාර්තාවක් පමණක් නිකුත් කර ඇති බව දන්වා තිබුණු අතර එහි වටිනාකම රු.126,132,194 ක් විය.

**3.8 අනාර්ථික ගනුදෙනු**

**------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා මුද්‍රණය කිරීම සඳහා ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, 2015 හා 2016 වර්ෂවලට අදාළ එම වාර්තා මුදල් අමාත්‍යාංශය විසින් මුද්‍රණය කර තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු හා මුද්‍රණ අවශ්‍යතාව ලෙස පිළියෙල කර තිබූ ලේඛනය අනුව, මුද්‍රිත වාර්තාවලින් (සිංහල) සියයට 75 ක් පමණ පාසල් සඳහා මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, 2016 ජුනි මාසය තුළ ලැබී තිබූ සිංහල, ඉංග්‍රීසි හා දෙමළ පිටපත් පිළිවෙලින් 2800 ක්, 1300 ක් හා 1150 ක් වුවද, ඉන් පිළිවෙලින් 2276 ක්, 635 ක් හා 794 ක් බෙදා හැරීමකින් තොරව ඉතිරි වී තිබුණි. 2016 වර්ෂයේදී, දෙපාර්තමේන්තුව විසින් 2014 හා 2015 වර්ෂවල එසේ ඉතිරි වූ වාර්ෂික වාර්තාවලින් කොටසක් රු.1,007,675 ක් වැය කර තැපැල් මඟින් පාසල් හා විශ්වවිද්‍යාල වෙත බෙදා දී තිබුණි. එම වාර්තාවල මුළු පිරිවැය රු.5,645,386 ක් වී තිබුණි. තාක්ෂණික දියුණුවත් සමඟ අන්තර්ජාලයෙන් මෙම වාර්තාව පරීක්ෂා කිරීමේ හැකියාව තිබියදීත් මෙලෙස අවශ්‍යතාවය ඉක්මවා වාර්තා මුද්‍රණය කිරීම අනාර්ථික ක්‍රියාවක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.9** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සංඛ්‍යාව** | **තථ්‍ය සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 14 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 23 | 16 | 07 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 11 | 03 |
| | **එකතුව** | **60** | **43** | **17** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ ගණනාවක සිට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් පුරප්පාඩුව පවතින අතර එම තනතුරුවල අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනය කර සුදුසු විසඳුමක් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. කෙසේ නමුත් කාර්යාල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා මෙම පුරප්පාඩු පිරවීම සිදු නොකළ බව දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ, ආර්ථික විද්‍යාඥ, සංඛ්‍යා ලේඛනඥ යන තනතුරු 03 පුරප්පාඩු පැවතියද 2016 වර්ෂයේ කාර්ය මණ්ඩල සමාලෝචනය මගින් එම තනතුරු අහෝසි කර ගෙන තිබුණි. නමුත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරිනියක් 2014 අප්‍රේල් 01 දින සිට වර්ෂ 02 ක් සඳහා අමාත්‍යාංශයේ බදු උපදේශක තනතුරට පත් කර තිබූ අතර එම නිලධාරිනියගේ සේවය නැවතත් වසර 02 කින් එනම් 2018 මාර්තු 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

(ඇ) එමෙන්ම තෘතීයික මට්ටමේ භාෂා පරිවර්තක තනතුරක්ද වසර ගණනාවක සිට පුරප්පාඩුව පවතින අතර එම පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවක් ඇති නොවුනු බව දෙපාර්තමේන්තුව විගණනය වෙත දන්වා තිබුණි.